# දැන්වීමයි

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 (MN-1) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

# Open Competitive Examination for Recruitment to the Posts of Non Technical Management Assistants Grade III of Category 2 for the Department of Local Government of Southern Province – 2020

** විශේෂයෙන් සැළකිය යුතුයි **

මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (**www.psc.sp.gov.lk**) හරහා අනිවාර්යෙන්ම ලියාපදිංචි වී අයදුම් කළ යුතුය.

**1.0** අංක **249** හා **2015.01.19** දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා **2015.09.28,2016.01.20,2018.04.04** හා **2019.10.28** දිනැතිව සංශෝධිත දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ **02** තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ **02** **(MN-1) III** ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින පහත දක්වා ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2020.12.04** දින වන අතර, මෙම විභාගය දෙසැම්බර් මස පැවැත්වේ.

<u>තනතුරු</u>

- වැඩ ක්ෂේත්‍ර පරිපාලක (Work /Field Supervisor)
- සෞඛ්‍ය පරිපාලක (Helath Supervisor)
- මැහුම් උපදේශක (Sewing Instructor)
- ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු/මධ්‍යස්ථාන භාරකරු (ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය) (Solid Waste Centtre Caretaker (Solid Garbage Project)
- වෙළඳපොළ පරිපාලක (Market Supervisor)
- පරීක්ෂණාගාර සහායක (Lab Assistant)

**2.0** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කෙරේ. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී පුරප්පාඩු සංඛ්‍යාවෙන් **50%** ක් විවෘත තරග විභාගයෙන් සහ **50%** ක් සීමිත තරග විභාගයෙන් බඳවා ගන්නා අතර, එසේ බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**3.0** පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**4.0** වැටුප : අංක **03/2016** හා **2016.02.25** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ **02 III** ශ්‍රේණිය සඳහා වන වැටුප් බාණ්ඩය **MN 1- 2016** වන අතර මාසික වැටුප් පරිමාණය **27,140/- -300x10-350x11-495x10-660x10- 45,540/-** වේ.

**5.0** මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම විභාගයෙන් දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ **02 (MN-1) III** ශ්‍රේණියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

**6.0** සුදුසුකම් :-

**I.** අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

**II.** දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**III.** පදිංචිය සනාථ කිරීම

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට "පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ අනුගාමී වසර 03ක අයදුම්කරුගේ ස්ථිර පදිංචිය හෝ පූර්වාසන්න වසර 03 ක කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමඟ අයදුම්කරුගේ එක් වසරක ස්ථිර පදිංචිය" සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කිරීම මඟින් විය යුතු ය.

(අ). මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උද්ධෘතය හා

(ආ). ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය.

**IV.** මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම ඒ ඒ තනතුරුවලට අදාළව පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(අ). සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) මැහුම් උපදේශක තනතුර සඳහා මාස 06කට නොඅඩු මැහුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**7.0** වයස :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**8.0** මාධ්‍ය :-විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**9.0** විභාග පරිපාටිය :-

අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් ඇතුළත් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය. (රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ)

- වැඩ ක්ෂේත්‍ර පරිපාලක/ සෞඛ්‍ය පරිපාලක/ වෙළඳ පොළ පරිපාලක / ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු/ මධ්‍යස්ථාන භාරකරු (ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය)/ පරීක්ෂණාගාර සහායක/ මැහුම් උපදේශක

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40% | පැය 1 |
| භාෂා හැකියාව (සිංහල / දෙමළ) | 100 | 40% | පැය 1 |

1. සාමාන්‍ය දැනීම - අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, සංඛ්‍යාත්මක කුසලතාවය හා අවබෝධය මැනීම, කාලීන හා සමාජීය සිදුවීම් පිළිබඳ දැනීම මැන බැලීම පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි.

2. භාෂා හැකියාව (සිංහල / දෙමළ) - අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයකු විසින් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40ක් වත් ලබා ගත යුතු අතර, තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු සපුරාලන පරිදි ලබාගත් කුසලතා අනුපිළිවෙල අනුව අපේක්ෂකයින් සේවයට බඳවා ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

**10.0** විභාග ගාස්තු:- විභාග ගාස්තුව රු. 600/- කි. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.

**11.0** විභාගය පැවැත්වීමට යෝජිත දිස්ත්‍රික්ක :-

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදි වේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේදී පවත්වනු ඇත. අයදුම්කරුවන්, නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

| දිස්ත්‍රික්කය | විභාග නගරය |
|---|---|
| ගාල්ල | ගාල්ල |
| මාතර | මාතර |
| හම්බන්තොට | තංගල්ල |

**12.0** අයදුම්පත්‍ර :-

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා මාර්ගගත ලෙස (Online) අනිවාර්යයෙන් ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, A4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) 2020 දෙසැම්බර් මස 04 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර, ඒ සමඟ කිසිදු ඇමුණුමක් නොඑවිය යුතුය. එම දෘඪ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 (MN-1) III ශ්‍රේණිය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාග - 2020" යන්න සඳහන් කරන්න.

ලේකම්,<br>
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
6වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,<br>
ගාල්ල.

**12.1** අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වීමේ දී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රීය ජංගම දුරකතන අංකයක් හා විභාග ගාස්තු ගෙවූ රිසිට් පත ද තිබීම අත්‍යවශ්‍ය වේ. විභාගය පිළිබඳ සියලුම තොරතුරු පසුව දැනුම් දෙනු ලබන්නේ ඔබ විසින් සපයන ලද ජංගම දුරකතන අංකය හරහා වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව ලැබෙන නියමිත අයදුම්පත්‍රයට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ළඟ තබා ගත යුතු වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ( www.psc.sp.gov.lk) මඟින් ලබා ගත හැකි අතර එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

**13.0** නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තැපැල් මඟින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**14.0** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තව ද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකථන අංක 0912248450 / 0912234309 ඔස්සේ දැන්විය යුතුය.

I. විභාගයේ නම
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම
III. සම්පූර්ණ ලිපිනය
IV. අයදුම්පත තැපැල් කළ කාර්යාලය හා ලියාපදිංචි කළ අංකය හා දිනය
V. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

**15.0** තෝරා ගැනීමේ ක්‍රමය

මෙම තනතුර සඳහා ඉහත දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරිම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහලම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.) යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

**15.1** සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුට ම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

**16.0** සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇයගේ සේවය අවසන් කිරීමට ඉඩ ඇත.

**17.0** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**18.0** **මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.**

**ගාමිණී වීරවික්‍රම**
**ලේකම්**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**2020 නොවැම්බර් මස 13 දින,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**6 වන මහල,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**ගාල්ල.**

**(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)**